# කාන්තාවන්ගේ වැඩි කැමැත්ත සැමියාට නොව පෙම්වතාට ලු

පවුල් ජීවිතයේදී ඔවුනොවුන්ගේ අත්‍යවශ්‍ය කටයුතු ඉටුකර ගැනීම සඳහා පිරිමියෙකු පෙම්වතෙකු ලෙස ගත කරණ කාලයේ දක්වන උනන්දුව ඔහු සැමියෙකු බවට පත්වීමත් සමඟ විශාල වශයෙන් හීන වන බව අන්තර් ජාතික මිත්‍රත්ව විමර්ශණ ඒකකය කළ පර්යේෂණයකින් හෙලි වෙයි.



එම පර්යේෂණ වාර්තාවට අනුව කාන්තාව සම්බන්ධයෙන් එහි සඳහන් වන්නේ ඊට ප්‍රතිවිරුද්ධ මතයකි. එනම් කාන්තාවකගේ එදිනෙකා කටයුතු කෙරෙහි ඇති උද්යෝගය ඉහළ යන්නේ පෙම්වතියක ලෙස නොව, බිරිඳක ලෙසින් බවය.

පිරිමියාට මෙන්ම ගැහැණියටද සමාන අයිතිවාසිකම් හිමිවිය යුතුයයි සිතන අය අතරේද මෙම තත්ත්වයේ පැහැදිලි වෙනසක් දකින්නට නැති බව මෙම පර්යේෂණ කටයුතුවලට සහය වූ වර්ජිනියා සරසවියේ සමාජ විද්‍යාඥයෙකු වූ ෂැන්ස් ඩේවිඩ් ප්‍රකාශ කර තිබුණි.

මෙම තත්ත්වය නිසා ඇමරිකාවේ විවාහ නොවී අඹු සැමියන් තම තමන්ගේ පෙම්වතුන් සමඟ එක වහලක් යට දිවි ගෙවන්නට කැමැත්තක් දක්වන කාන්තාවන්ගේ ප්‍රවණතාව සීග්‍රයෙන් ඉහළ ගොස් ඇතැයි සඳහන් ය.

එසේ වුවද මෙම අවිවාහක පවුල්වල පවා පෙම්වතියට වඩා පෙම්වතා විශාල ආදායමක් ලබන්නේ නම් එවැනි නිවෙස්වල කටයුතු වැඩි වශයෙන් පෙම්වතියට භාර ගන්නට සිදුව ඇති බවක් ද දක්නට ඇත.

නීත්‍යානුකූලව විවාහ වී ඇති පවුල්වල තත්ත්වය ඊට ඉඳුරාම වෙනස්ය. එවැනි පවුලක බිරිඳ සැමියාට වඩා ඉහළ ආදායමක් ලැබුවද ගෙදර වැඩ වැඩ කොටසක් ද කළ යුතු වන්නේ බිරියන්ටය.

## තරබාරු බව බෝවන රෝගයක්



දුටුගැමුණු මහරජතුමා ලඟ සිටි දසමහා යෝධයින් පිළිබඳ ළමා කාලයේ ඉතා රසවත් කථා අසා ඇති ශ්‍රී ලාංකිකයින් එම යෝධයින් තම තමන්ගේ සිත් සතන් හී සටහන් කර ගන්නට ඇත්තේ සාමාන්‍ය මිනිසුන්ට වඩා ඉතා උස මහත ශක්තිමත් පිරිසක් ලෙසින් විය යුතුය.

එසේ මවාගත් දස මහා යෝධයින් පිළිබඳ ඒ හැම කෙනෙක්ම එකල මහත් උජාරුවෙන් උදම් අනන්නටද ඇත.

එහෙත් අපේ පැරැන්නන් අතරේ ''අති දීර්ඝෝ මහා මෲර්ගෝ'' යනුවෙන් මහත් ප්‍රසිද්ධියක් ඉසුලූ කියමනක් ද තිබුණු බව සිහිපත් කළ යුතුය.

එම කියමනෙන් ග්‍රම්‍ය වූයේ පමණට වඩා උස මහත පුද්ගලයින් මෲග නැතහොත් මෝඩ පිරිසක් බවය.

එහි සත්‍යතාවක් ඇතත් නැතත් මේ මෑතක ඇමරිකාවේදී සිදුකරණ ලද පර්යේෂණයකින් අනාවරණය කරගෙන ඇති කරුණු අනුව නම්, අධික තරබාරු බව බෝවන රෝගයක් ලෙස සමාජය තුළ පැතිරී යා හැකි බවට අනතුරු හඟවා තිබුණි. සාමාන්‍ය සිරුරක් ඇති තැනැත්තෙකු විසින් ඇසුරු කරනු ලබන මිතුරෙකු හෝ මිතුරියක නැතහොත් එම තැනැත්තාගේ සහෝදරියක සහෝදරයෙකු හෝ ඔහුගේ හෝ ඇගේ බිරිඳ හෝ ස්වාමි පුරුෂයා තරබාරු නම් මුල් තැනැත්තාට ද එම තරබාරු බව පසුකලකදී බෝවිය හැකි බව එම පර්යේෂණයේ නිගමනනය ලෙස සඳහන්ය.

එකී පර්යේෂණයේ අවසන් නිගමනයට එළඹීම සඳහා පර්යේෂකයින් විසින් පුද්ගලයින් 12000 කට වැඩි පිරිසක් ඊට සහභාගි කරගෙන තිබුණි.




එහිදී හෙළිකර ගත් කරුණු අනුව තරබාරු බව කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝවීමේ අවදානම මිතුරෙකු ගෙන් නම් සියයට 57 ක ප්‍රතිශතයකි. එය සහෝදරයෙකු ගෙන් හෝ සහෝදරියක ගෙන් නම් සියයට 40 ක ප්‍රතිශතයක් ලෙස දක්වා ඇති අතර, භාර්යාව ගෙන් හෝ සැමියාගෙන් බෝවීමේ ප්‍රතිශතය සියයට 37 ක් ලෙස ප්‍රකාශ කර ඇත.

ඇමරිකාවේ හාවඩ් වෛද්‍ය විද්‍යාලයේ හා කැලිෆෝනියා සරසවියේ මහාචාර්යවරු පිරිසක් මෙම වාර්තාව එළිදක්වා ඇත්තේ ඔවුන් විසින් පසුගිය වසර 32 ක කාලයක් තිස්සේ එක් රැස් කරන ලද තොරතුරු ඔස්සේ කරන ලද පර්යේෂණයකින් අනතුරුවය.

මෙම පර්යේෂණයට පුද්ගලයින් කැමැත්තෙන්ම ඉදිරිපත්ව ඔවුන්ගේ පවුල්වල තොරතුරු සියල්ලක් හා ඔවුන් ඉතා ලගින් ඇසුරු කරන මිතුරු මිතුරියන් පිළිබඳ තොරතුරු ලබා දී තිබුණි. තවද තරබාරු බව බෝවීමේදී වඩාත් වේගවත් බවක් දක්නට ඇත්තේ සමාන ලිංගික පාර්ශවයන් අතර බවද එහි වැඩිදුරටත් සඳහන්ය.

කෙසේ වුවත් මෙම පර්යේෂණ වත්මන් සමාජයට අවධාරණය කර ඇත්තේ තරබාරු බව සමාජයෙන් බැහැර කිරීම සඳහා ශාරීරික යෝග්‍යතාවට වඩා සමාජ සංකලනය හා සබඳතා පිළිබඳ වැඩි අවධානයක් යොමුකළ යුතු බවය.

කෙනෙකුගේ තරබාරු බව තවත් තරබාරු පිරිසක් අතරේ සිටියදී හෝ මෙතුවක් කලක් ප්‍රශ්නයක් නොවූ අයට වුවද මින් ඉදිරියට මෙම පර්යේෂණ වාර්තාව විශාල මානසික වදයක් ඇති කරනු ඒකාන්තය.

එබැවින් මෙම තොරතුරු කෙතරම් සත්‍ය වුවද තරබාරු පුද්ගලයින් නම් එය පිළිගැනීමට එතරම් කැමැත්තක් දක්වනු ඇතැයි සිතිය නොහැකිය.

- මලිඳු කවිලංක එදිරිවීර -




# SL Cricket in Australia

Focus on the 2 tests / Can Murali gain the 9wkts?

George Mendis



Sri Lankans in SL and the big number in Australia are anxiouisly hoping for a win at one of the Tests and a draw in the other --and also Murali getting at least 9wickets --overpowering Ponting's remarks that Oz will not allow M to beat Warne's record. SL is now giving a sound Warne-ing to Ponting that M will bowl him out with highly spun Dooshras and gather more wickets than required to outbeat Warne--the Oz simple leg spinner.

Vaas/Malinga/Dilhara. All this means that SL has to be well prepared before the clash on::

Preparation/special training to meet tough/long situations.... Managing efficiently the wiles and traps laid out for our bats ....Aussie strong points and weaknesses / placement of the good dielders e.g a good short leg for Ponting, alert/active fielders at squareleg/overhead for Hayden/Gilchrist..... Mind set training of our batsmen to avoid victimisation by traps ..say at square leg for Sanath/Sanga and also preserve emotiomal balance at crude remarks and sledging .....etc etc

As we in the Island are very keen on our SL vs Oz cricket challenges , let me make a few suggestions on our own cricket giants ::--

Batting---Santh J has to score yet stay long until the opening stand reaches &0-100,While he chases the ball out of the lines often, let patience win the day with more ones/twos-

## Australia Vs Sri Lanka

Thu Nov 8 -Mon Nov 12
Australia v Sri Lanka at Brisbane, 1st Test

Fri Nov 16 - Tue Nov 20
Australia v Sri Lanka at Hobart, 2nd Test

The Aussies say they are well prepared and trained to meet the bowling strengths of Murali and the pacemen

27 පිටෙන්

20 ක්‍රිකට් තරගාවලියේදී කෙසේ නම් අවසන් තරගයට පැමිණියේද යන්න සලකා බලන ලෙසය.

කොහොම නමුත් පන්දුවාර 20 ක්‍රිකට් තරගාවලිය නීති විරෝධී පන්දු යැවීම මඟ හරවා ගැනීමට පන්දු යවන්නන්ට හොඳ පදනමක් දමනු ලැබූ බව පැහැදිලිය. එහි හොඳ ප්‍රවනතාවක් පෙන්වීය. ඒ වගේම ක්‍රීඩාංගණ තුනක් ප්‍රයෝජනයට ගනිමින් දිනකට තරග දෙක තුනක් බැගින් පවත්වමින් විශේෂයෙන්ම එක් දිනකදී එක ක්‍රීඩාපිටියක තරග දෙකක් බැගින් පවත්වා දින 14 ක් වැනි කෙටි කාලයකදී උපරිම ආශ්වාදයක් බෙදා දෙමින් ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියක් නිම කිරීම කාලයේ හැටියට ඉතා අගය කළ යුතුය.

නැටුම් ගැයුම් වැයුම් සහිතව ඉතාමත් සිත් ඇඳ ගන්නා සුළු තරගාවලියක් සංවිධානය කිරීමට දකුණු අප්‍රිකාව සමත් වී තිබුණි.

ක්‍රිකට් ක්‍රීඩාවේ අලුත්ම නීති හා නවතම අත්දැකීම් පැරණි රසාංග, ආදී මේ හැම දෙයක්ම එම තරගාවලිය පැවැත්වෙන අතරතුර අත්විඳීමේ අවස්ථාව හැම කෙනෙකුටම හිමිවිණි.

නීති විරෝධී පන්දුවට නිදහස් පහර එල්ල කිරීම, ලකුණු සම වූ තරගයකදී දෙපිලේ ක්‍රීඩකයින් පස්දෙනෙකු බැගින් ඉදිරිපත් වී පන්දුව බැගින් යවමින් කඩුලු බිඳ ජයග්‍රාහී පිල තෝරා ගැනීම, එක් පන්දු වාරයකදී හයේ පහර හයක් එල්ල කිරීම, කඩුලු ත්‍රිත්වයක් දවා ගැනීම, පන්දු වාර 20 හොඳම කණ්ඩායම් ඉනිමේ ලෝක වාර්තාව බිඳ දැමීම ආදී බොහෝ දේ තරගාවලියෙන් මතුවූ සදාතනික සිහිවටනයන් ය.

එහෙත් ක්‍රිකට් ක්‍රීඩාවේදී විශේෂයෙන්ම පිතිකරුවකු අනුගමනය කළ යුතු තාක්‍ෂණික මුලධර්ම පන්දුවාර 20 ක්‍රිකට් ක්‍රීඩාව නිසා නුදුරු අනාගතයේදී සෝදාපාළුවට ලක්වීමට ඇති අවදානම නම් භයංකාර තත්ත්වයක් බව නොකියාම බැරිය.

.Sanath is still our Goliath on the runs .Sangakkara has the shots to prove his world class yet patience is essential as the sheet anchor for him to hold the fort..
Mahela J is on a bad patch--this will get erased out as we are sure his square drives and pulls for sixes will come true with a little more calmness/ From among the middle order Chamara can go his normal way--yet Mubarak and Mahroof should use the long handle more and pick the correct balls seeing the field placemnts carefully.
Bowling-Sl awaits gains from Vaas with the use more of his revere swiings --we rely on Malinga ron his yorkers, on Dilhara with his bumbers blended in between witha secretive slow balls.
Muraliu with his dooshras will create the ground for the bowlers reap the benefits
Fielding will be the crucial factor--GHP trio cannot be given a second chance--Hayden/Ponting will be the thorns. Captaincy by Mahela is OK--yet collective effort by the team in regular consutation with seniors will make it a day for SL.

My final shot--heres the latest news from Australia on around 13th Nov and later--
Sri Lanks beats Australia- win one win and a draw . Murali gets over 9wickets and is proclaimed the world's best spinner. at a Test /draws the 2nd eh other